ඉරිදා ලංකාදීප

2021 පෙබරවාරි මස 14 වැනිදා ඉරිදා

# ඉන්දු-ලංකා බෞද්ධ සබඳතා පිළිබඳ සාකච්ඡාවක්



ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථානවල වැඩ වාසය කරන හා එම ස්ථාන භාරව සිටින එහෙත් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙරටට වැඩම කර සිටින මහා සංඝරත්නය හා උරුමයක උල්පත හා පාත්ෆයිඩර් පදනම නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා අතර සාකච්ඡාවක් පසුගියදා කොළඹ මහාබෝධි විහාරස්ථානයේදී පැවැත්විණි. මහා බෝධි සංගමයේ සභාපති සහ ජපානයේ ප්‍රධාන සංඝනායක බානගල උපතිස්ස හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම අවස්ථාවට සහභාගි වූ මහා සංඝරත්නය ඉන්දු ලංකා දෙරට අතර බෞද්ධ සබඳතා සම්බන්ධයෙන් අදහස් දැක්වූහ.

ශ්‍රී ලංකාරාමය, රජගහනුවර හි පල්ලේගම විජිත, නවදිල්ලි මහාබෝධි ආයතනයේ හකුරුගම්මන සද්ධාතිස්ස, මූලගන්ධකුටි විහාරයේ හප්පිටියේ ධම්මරතන, මහාබෝධි ඔරිස්සා හි පල්ලේගම අස්සජි, මහාබෝධි සාංචි හි බානගල විමලතිස්ස සහ බෝපාල් හි නුගගොල්ලේ චන්දරතන යන හිමිපාණන් වහන්සේලා සහ උරුමයක උල්පත පදනමේ මහ ලේකම් ආර්.ඒ.ඩී. සිරිසේන සහ අනුර අබේසේකර යන මහත්වරු ද මෙම අවස්ථාවට සහභාගි වූහ.